# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බෞද්ධ සංස්කෘතිය

### 04 වන පාඩම ; ශාසනික කටයුතු හෙවත් පිංකම් පිළිබඳ සිරිත් විරිත්

[[ 2024/2025 ]] 03 වන ප්‍රශ්නය

I –

II වස් කාලය හා කඨින චීවර පූජාව පිළිබඳව මූලික අවශ්‍යතා ඇතුළත් වනසේ හැඳින්වීමක් කරන්න.

III බෞද්ධ ශාන්ති කර්ම උදාහරණ සහිතව හඳුන්වන්න.එයින් එක් උදාහරණයක් මූලික අවශ්‍යතා දක්වමින් විස්තර කරන්න.

[[ 2019/2020 ]] 02 වන ප්‍රශ්නය

I බෞද්ධ ශාන්ති කර්මවල අරමුණ දක්වා, එබඳු ශාන්ති කර්ම තුනක් කෙටියෙන් හඳුන්වන්න.

II ත්‍රිවිධ චෛත්‍ය හඳුන්වා,එහි ආගමික වැදගත්කම විස්තර කරන්න.

III බෝධි පූජාවේ ඓතිහාසික හා ආගමික අගය පැහැදිලි කරන්න.

[[ 2018/2019 ]] 01 වන ප්‍රශ්නය

I බෞද්ධ භික්ෂුවගේ වස් විසීමේ චාරිත්‍රය ආරම්භ වීමට හේතුවූ කරුණු විමර්ශනය කරන්න.

II ගිහි-පැවිදි සම්බන්ධය වර්ධනය කිරීම සඳහා වස් කාලය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

III කඨින චීවරය හඳුන්වා, එය සකස් කිරීමේදී අනුගමනය කෙරෙන චාරිත්‍ර විධි විස්තර කරන්න.

[[ 2015/2016 ]] 03 වන ප්‍රශ්නය

I ත්‍රිවිධ චෛත්‍ය හඳුන්වා මේ අතර බෝධීන් වහන්සේට විශේෂ ස්ථානයක් හිමිවන ආකාරය පැහැදිලි කරන්න.

II –

III බෝධි පූජා පැවත්වීමේදී ශ්‍රී ලාංකේය නූතන බෞද්ධයන් අනුගමනය කරන චාරිත්‍ර විධි විස්තර කරන්න.

[[  2011/2012 ]]     03 වන ප්‍රශ්නය

I ධර්ම දානය යනු කුමක්දැයි හඳුන්වා, සමාජීක අවස්ථා අනුව ධර්ම දේශනා විවිධත්වයක් ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

II ධර්ම දේශනයක් පැවත්වීමේ දී දේශකයන් වහන්සේලා අනුගමනය කරන චරිත්‍රානුගත පිළිවෙළ කෙබඳු වූවක්දැයි පහදන්න.

III ධර්මිෂ්ඨ සමාජයක් ගොඩනැංවීමෙහිලා ධර්මශ්‍රවණය උපයෝගී කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

[[  2007/2008 ]]     03 වන ප්‍රශ්නය

I –

II –

III බෝධි පූජා ඉතිහාසය කෙටියෙන් දක්වා වර්තමාන බෝධි පූජාවේ ඇති චාරිත්‍ර පිළිබඳ විමසීමක් කරන්න.

[[[[[ 2005 ]]]]]     03 වන ප්‍රශ්නය

I –

II ආමිෂ දානය හඳුන්වා, එය ධර්ම දානයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

III බෞද්ධ චාරිත්‍ර විධියක් වශයෙන් පිරිත් දේශනාවේ පවත්නා වැදගත්කම විස්තර කරන්න.

[[[[[ 2004 ]]]]]     02 වන ප්‍රශ්නය

I –

II කඨින චීවරය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

03 වන ප්‍රශ්නය

III පරිත්ත යන්න හඳුන්වා පරිත්‍රාණ ධර්මය අඩංගු ග්‍රන්ථයෙහි බණවර කොපමණ දැයි සවිස්තරව දක්වන්න.

[[[[[ 2002 ]]]]]     03 වන ප්‍රශ්නය

I සංඝික දානය,කඨින දානය,ධර්ම යාත්‍රා යන පුණ්‍ය කර්ම කෙටියෙන් හඳුන්වන්න.

II ධර්ම යාත්‍රා නමින් හැඳින්වෙන පුණ්‍ය කර්ම බෞද්ධ ජන ජීවිතයට ප්‍රයෝජනවත් වන අයුරු පැහැදිලි කරන්න.

III වන්දනා පිරිසකගේ නායකයා ඔබ නම් ඔබ සමඟ යන වන්දනාකරුවන්ට දෙන උපදෙස් අටක් ලියන්න.

[[[[[ 2001 ]]]]]     02 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ පිළිබඳ ත්‍රිවිධ චෛත්‍ය නාමික වශයෙන් දක්වන්න.
II එම නම්වලින් පැවසෙන අර්ථ පැහැදිලි කරන්න.
III ත්‍රිවිධ චෛත්‍ය වන්දනාවෙන් ලැබිය හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

[[[[[ 1997]]]]]     02 වන ප්‍රශ්නය

I "සබ්බ දානං ධම්මදානං ජිනාති." මෙහි අදහස සැකෙවින් දක්වන්න.
II ධර්ම ශ්‍රවණය කරන අවශ්ථාවකදී අප විසින් පිළිපැදිය යුතු වැදගත් චාරිත්‍ර තුනක් ලියන්න.
III ධර්ම ශ්‍රවණයෙන් අපට ලැබිය හැකි ප්‍රයෝජන ගැන විස්තරයක් කරන්න.